**මැදවච්චිය ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**----------------------------**

**01. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 06 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ රු.1,362,406 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු, ආදායම් හා වියදම් ගිණුමේ රු.1,663,646 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.134,810 ක්වූ උපචිත වියදම් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**
**-----------------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.14,939,587 ක් වුවත් එදිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව ණය ශේෂය රු.6,038,592 ක් වූයෙන් රු.8,900,995 ක වෙනසක් අනාවරණය විය.

**02.** **මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.4,864,377 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලැබී තිබුණු මෙහෙයුම් අතිරික්තය රු.7,205,412 ක් විය.

**2.2.** **ආදායම් පරිපාලනය**

------------------------

**2.2.1** **වරිපනම් බදු**

---------------

2015 දෙසැම්බර් 31 දිනට රු.1,098,459 ක්වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 155 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.2** **බදු කුලී**

---------

(අ) කඩ කාමර 07 ක් බදුදීම වෙනුවෙන් තවදුරටත් අයවිය යුතු රු.962,077 ක්වූ හිඟ බදු කුලී අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපොල සහ වෙළඳ සංකීර්ණ කඩ කාමර කුලී ලෙස අයවියයුතුව තිබෙන රු.957,862 ක් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික වෙළඳ අයිතිය බදුදීම්වලින් රු.1,181,142 ක්වූ හිඟ බදු කුලී අයවියයුතු පාර්ශවයන් හඳුනාගෙන ඇතත් එම මුදල් අයකර ගැනිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) පූර්ව වර්ෂ 10 ක් ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට පොදු වෙළඳපල කඩකාමර 23 ක වෙළඳාම් සිදු නොවීම නිසා කඩහිමියන් කඩකාමර අත්හැර දැමීම හේතුවෙන් සභාවට අහිමි වී තිබුණු කුලී ආදායම රු.2,070,000 බව නිරීක්ෂණය විය.

**2.2.3** **බලපත්‍ර ගාස්තු**

-----------------

2015 දෙසැම්බර් 31 දිනට රු.725,790 ක්වූ හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.4** **මුද්දර ගාස්තු**

-----------------

2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් අයවිය යුතුව තිබෙන රු.3,821,500 ක්වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේදී හෝ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ස්ථානමාරුවී ගිය, මියගිය,විශ්‍රාම ගිය සහ සේවය අතහැර ගිය තිබුණු සේවකයින් 13 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.201,212 ක්වූ සේවක ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වර්ෂ 03 සිට 05 ක කාලයක් ඉක්මවා තිබෙන එකතුව රු.17,497,678 ක්වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂයේදී හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසර 03 සිට 07 ක් ඉක්මවූ එකතුව රු.3,309,311 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 06 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නාගදරනැව ගම්සහා ගොඩනැගිල්ල සහ එම ඉඩමේ වසර 20 ක පමණ සිට අනවසර පුද්ගලයකු පදිංචි වී ඇති බව අනාවරණය වූ අතර එම පුද්ගලයා ඉවත් කිරීමට නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ඉ) වටිනාකම රු.1,648,500 ක් වූ වාහන 2 ක් මෝටර් රථ පනතේ( 203 වන අධිකාරිය) 2 (1) වගන්තිය, ප්‍රකාරව ලියාපදිංචි නොකර ධාවනයේ යොදවා තිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

---------------------------

**නිශ්ක්‍රීය වත්කම්**

--------------------

(අ) මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම අනාවරණය කර නොතිබුණු ඉඩම් හා ගොඩනැගිලි 06 ක් වසර 02 සිට වසර 20 ක් ඉක්මවූ කාලපරිච්ඡේදයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 1998 වර්ෂයේදී සභාවට ලැබී තිබුණු රු.1,232,000 ක් වූ වාහන දෙකක් වසර 10 ක සිට අබලන්ව නිශ්කාර්යය වී තිබුණි.

### 3.3 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

------------------------

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහනේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ ප්‍රගති වාර්තාව අනුව රු.2,000,000 ක් වූ ව්‍යාපෘති 05 ක මූල්‍ය ප්‍රගතිය 100% ලෙස දක්වා ඇතත් එම ව්‍යාපෘති 2016 මැයි 09 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ අනුමත වී තිබුණු පසුගාමී හා හුදෙකලා ගම්මාන සංවර්ධන ව්‍යාපෘති 15 අතරින් රු.2,000,000 ක්වූ ව්‍යාපෘති 12 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.4** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එකතු කරන කැලිකසල සහ ඝන අපද්‍රව්‍ය ඉසින්බැස්සගම වන රක්ෂිතයට මුදාහැර තිබුණු අතර කැලිකසල ආහාරයට ගැනීමට එන වන අලින්ගෙන් පවිත්‍ර සේවකයන්ට සහ අවට ප්‍රදේශවාසීන්ට උවදුරු මතුවී තිබුණු අතර, පරිසර හානියක්ද සිදුවෙමින් පැවතුණි.

**04.** **පද්ධති හා පාලනය**

**-----------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ණයගැති/ණයහිමි පාලනය
(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය